# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1950/37 - 2016 ජනවාරි මස 20 වැනි බදාදා - 2016.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ඌව පළාත් ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154ඊ. ව්‍යවස්ථාවේ (4) හා (05) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී අති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඌව පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුබසාධන අමාත්‍ය ගරු රත්නායක මුදියන්සේලාගේ කුමාරසිරි රත්නායක මැතිතුමා,

ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉඩිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් අමාත්‍ය ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා 2016 ජනවාරි මස 15 වන දින සිට 2016 ජනවාරි මස 26 වන දින දක්වා විදේශ ගත වන හෙයින්, 2016 ජනවාරි මස 15 වන දින සිට එතුමා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක්, ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය ධූරයෙහි හා එකී විෂයභාර අමාත්‍ය ධූරයෙහි වැඩ බැලීමට

ඇම්. පී. ජයසිංහ,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2016 ජනවාරි මස 13 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

02 - 138


1A - PG 2799 — 31 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*